# ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028)

## මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපාය මාර්ගය යටතේ ක්‍රියාත්මක වන මුලපිරීමකි.



"මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක් කරා"


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මුල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික කවුන්සිලය සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ කළමනාකරණ කමිටුවෙහි මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික මට්ටමේ පාර්ශවකරුවන් හතළිහකට අධික පිරිසකගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය සකස් කර ඇත.

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ මූලික අදියරේදී අදාළ පාර්ශවකරුවන් නිසි පරිදි හඳුනාගැනීම සඳහා තාක්ෂණික සහ මූල්‍යමය වශයෙන් අනුග්‍රහය දැක්වීම, පාර්ශවකරුවන් වෙනුවෙන් ආරම්භක උපදේශන වැඩමුළු පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම මෙන්ම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශ ප්‍රකාශනයේ ආරම්භක සැලැස්ම සමාලෝචනය කිරීම IFC- DFTA Women in work වැඩසටහන යටතේ ඕස්ට්‍රේලියානු රජයේ ද සහය ඇතිව ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව විසින් සිදු කරන ලදී.

මුල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානය (AFI) මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ තාක්ෂණික සමුළු මෙන්ම එම සන්ධානය මඟින් මූල්‍ය සාක්ෂරතාවය සහ අදාළ අනෙකුත් විෂය ක්ෂෙත්‍රයන් පිළිබඳ සම්පාදනය කර ඇති ප්‍රකාශනයන් ද මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය වැඩි දියුණු කිරීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇති කරගත් නිල සහයෝගීතාවයට අනුව මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය එළි දැක්වීම, එය සකස් කිරීම හා එහි මුද්‍රණ කටයුතු සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූල්‍ය අනුග්‍රහය දක්වන ලදී.

# පසුබිම

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකු සමූහයට අයත් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (IFC) සමඟ එක්ව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යටතේ ප්‍රථම වරට ජාතික මට්ටමේ මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. ඒ සඳහා ගෘහ ඒකක 4,800ක නියැදියකින් සමන්විත රටෙහි සන්දර්භයට  ගැලපෙන ලෙස සකස් කරන ලද ජාත්‍යන්තර ක්‍රමවේදයක් භාවිතා කරන ලදී.

මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා පසුබිම හඳුනාගැනීම සහ නිර්ණය කිරීමයි.

මෙම සමීක්ෂණය මඟින් ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම, මූල්‍ය ආකල්ප සහ මූල්‍ය හැසිරීම පිළිබඳව අධ්‍යයනය කෙරිණි. එහිදී ලද ප්‍රතිචාර මත ඉහත සඳහන් කළ එක් එක් ගුණාංගය සඳහා ලකුණක් පිරිනමන ලදී.

මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව පැහැදිලි වූයේ ශ්‍රී ලාංකිකයින්ගේ මූල්‍ය දැනුම සහ මූල්‍ය ආකල්ප, අනෙකුත් රටවල් සමඟ සසඳන කල සතුටුදායක මට්ටමක පවතින බවත්, මූල්‍ය හැසිරීම තවමත් පසුගාමී තත්ත්වයක පවතින බවත් ය.


ශ්‍රී ලාංකිකයින්ගේ සැලකිය යුතු මට්ටමේ මූල්‍ය දැනුම සඳහා ඉවහල් වූයේ මූල්‍ය සාක්ෂරතා මට්ටම වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කළ සියලු පාර්ශවයන් විසින් දශක ගණනාවක් තිස්සේ සිදු කළ දීර්ඝකාලීන ප්‍රයත්නයන් විය හැකිය. කෙසේ වෙතත්, ධනාත්මක මූල්‍ය හැසිරීම සඳහා පෙළඹවීම පිළිබඳව යොමු කරන ලද අවධානය ප්‍රමාණවත් නොවේ. අනෙක් අතට, සියලු පාර්ශවයන්ගේ මෙම ප්‍රයත්නයන් සමස්ථ ආර්ථිකය පුරා බණ්ඩනය වී විසිරී පවතී. එම නිසා මෙම මුලපිරීම්වල කාර්යක්ෂමතාවය කීප ගුණයකින් වැඩි කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් සැපයිය යුතුව ඇත.


මෙම සටහනෙහි ඉදිරි පිටු කිහිපය මඟින්  ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය හා මූල්‍ය  සාක්ෂරතාව පිළිබඳ පැතිකඩක් ඉදිරිපත් කර ඇත.

# මූල්‍ය අන්තර්ගතභාවයේ පැතිකඩ - 2021

## ප්‍රවේශය


ගිණුම් හිමියන් ( ඕනෑම ගිණුමක්)
(වයස 15ට වැඩි %)



**89.3%**
65.8%ක් වූ දකුණු ආසියාතික ගිණුම් හිමි කාන්තාවන්ගේ සාමාන්‍ය හා සසඳන විට, ශ්‍රී ලාංකික ගිණුම් හිමි කාන්තාවන් ප්‍රමාණය 89.3% ක් වේ.


ගිණුම් හිමියන් ( ඕනෑම ගිණුමක්)
(වයස 15ට වැඩි %)





සම කලාපීය සහ සම ආදායම් රටවල් හා සසඳන විට, ගිණුම් හිමි තරුණ පිරිස් (වයස 15-24 ) ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ඉහළ මට්ටමක පවතී.




ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මූල්‍ය ගිණුම් හිමියන්
(වයස 15ට වැඩි %)




මූල්‍ය ආයතනික ගිණුම් හිමියන්
(වයස 15ට වැඩි %)





මූල්‍ය ආයතනයන්හි ගිණුම් හිමියන්ගෙන් 32%ක් මුල් වරට ගිණුමක් විවෘත කර ඇත්තේ වැටුපක් හෝ රජයේ ගෙවීමක් ලබා ගැනීම සඳහාය


# භාවිතය

### ඩිජිටල් ගණුදෙණු සිදු කිරීම
### (වයස 15ට වැඩි % )

**55%**

වැඩිහිටියන්ගෙන් 55%ක් වසරක් ඇතුළත ඩිජිටල් ගණුදෙණු සිදු කර ඇති අතර එය 2017 සිට 17%ක වැඩි වීමක් පෙන්නුම් කරයි




**47.5%**

ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් වසරක් ඇතුළත ඩිජිටල් ගණුදෙණුවක් සිදු කර ඇත

කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාවේ ඩිජිටල් මූල්‍ය හැසිරීම්වලට ධනාත්මක ලෙස බලපා ඇත.

| කොවිඩ්-19 වසංගතය අතරතුර පළමු උපයෝගීතා ගෙවීම සිදු කිරීම | | කොවිඩ්-19 වසංගතය අතරතුර පළමු ඩිජිටල් වෙළඳ ගෙවීම සිදු කිරීම |
|---|---|---|
| 16.9% | ශ්‍රී ලංකාව, | 9.6% |
| 7.7% | දකුණු ආසියාව | 6.3% |
| 7.1% | පහළ මැදි ආදායම් රටවල් | 6.5% |

### මුදල් ඉතිරි කිරීම
### (වයස 15ට වැඩි %)




**51%**

මුදල් කළමණාකරණය සඳහා ගිණුමක් භාවිතා කර ඇත

**11.7%**

ඉතුරුම් සමාජයක් හෝ පවුලෙන් පිටත පුද්ගලයෙකු භාවිතයෙන් ඉතිරි කර ඇත.

### ණය ගැනීම්
### (වයස 15ට වැඩි %)

41.9%ක් යම් මුලාශ්‍රයකින් යම් මුදලක් ණයට ගෙන ඇති අතර එම හැසිරීම සම කලාපීය රටවල් සමග සැසඳේ.
ශ්‍රී ලංකිකයින් විධිමත් මුලාශ්‍ර වලින් ණය ගැනීම සම කලාපීය රටවල් හා සසඳන කළ ඉදිරියෙන් පවතී.


| 22% | 12% | 13% |
|---|---|---|
| ශ්‍රී ලංකාව | දකුණු ආසියාව | පහළ මැදි ආදායම් රටවල් |

**48%**

48% ණය ලබාගත් පුද්ගලයින් අවධිමත් ණය මූලාශ්‍ර මත යැපේ


මූලාශ්‍රය - Global Findex 2021

# මූල්‍ය සාක්ෂරතා පැතිකඩ - 2021





S&P අන්තර්ජාතික මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය 2014

**58%** සාමාන්‍ය මට්ටමේ ස්ත්‍රී පුරුෂ පරතරය සහිත මූල්‍ය සාක්ෂරතා අනුපාතයක්




මූල්‍ය දැනුම, ආකල්ප සහ හැසිරීම අනුව ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය ධාරිතාව ද 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, අන්තර්ජාතික මූල්‍ය සහයෝගිතාවය සමඟ සිදු කරන ලද මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය මගින් මනින ලදී.




ඉහළ මූල්‍ය දැනුමට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ මූල්‍ය හැසිරීම අඩු මට්ටමක පවතී.

| සංරචකය | ලබා ගත හැකි උපරිම ඇගයීම් මට්ටම | ලබා ගත් ඇගයීම් මට්ටම (සාමාන්‍ය) | අවම ඉලක්කගත ඇගයීම් මට්ටම |
|---|---|---|---|
| දැනුම | 07 | 5.03 | 05 |
| ආකල්ප | 05 | 2.65 | 03 |
| හැසිරීම | 09 | 4.44 | 06 |
| සමස්ත ඇගයීම් මට්ටම | 21 | 12.12 | 14 |

සමීක්ෂණ වාර්තාව www.cbsl.gov.lk මගින් ලබා ගත හැක.

ඉහත කරුණු අනුව ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම ධනාත්මක මූල්‍ය හැසිරීම් බවට පරිවර්තනය කිරීමේ ගැටලුවක් පවතින බව නිරීක්ෂණය වේ. පුද්ගලයන්ගේ මූල්‍ය සාක්ෂරතාවය රටේ ආර්ථික වර්ධනයට සහය විය හැකි උත්ප්‍රේරකයක් වන බැවින් ජාතික මට්ටමින් මෙම කරුණ පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතුය.

ඒ අනුව, පුළුල් ලෙස සලකා බලන විට, වැඩිදියුණු කළ මූල්‍ය සාක්ෂරතාවයක් හරහා ඉහළ මූල්‍ය අන්තර්ගත මට්ටමක් කරා ළඟා වීමට වඩාත්ම සුදුසු මෙවලම ලෙස ජාතික මට්ටමේ මූල්‍ය සාක්ෂරතා මුලපිරීමක් සැලකිය හැකිය.

# පෙරවදන

ශ්‍රී ලංකාව සඳහා වූ ප්‍රථම මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ මූල්‍ය සාක්ෂරතා සහ ධාරිතා සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක කෙරෙන ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය මඟින් ශ්‍රී ලාංකිකයින්ගේ මූල්‍ය හැසිරීම වැඩි දියුණු කිරීමත්, ඔවුන්ගේ මූල්‍ය හැකියාවන් ඉහළ තලයකට ඔසවා තැබීමත් යන මූලික ප්‍රතිපත්තිමය අරමුණ කරා ළඟා වීමට සියලු මූල්‍ය සාක්ෂරතා පාර්ශවකරුවන් හට සාක්ෂි මත පදනම් වූ මාර්ගෝපදේශකත්වයක් සපයනු ලැබේ.




රූප සටහන 1 _ උපායමාර්ගික රාමුව - මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය

මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගික ලේකම් කාර්යාලය හරහා දියත් කරන ලද බහු පාර්ශවීය ප්‍රයත්නයකි. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ සංවර්ධන කටයුතුවලට සමගාමීව, මෙම මාර්ගෝපදේශයේ සංවර්ධන කටයුතු සඳහා වූ ලෝක බැංකු සහයෝගය වඩාත් පුළුල් කර ඇත.

මෙම මාර්ගෝපදේශය සංවර්ධනය කර ඇත්තේ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා සහාය වීම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය හැසිරීම හා ශ්‍රී ලාංකිකයින්ගේ දිගුකාලීන සමස්ථ මූල්‍ය හැකියාව දියුණු කිරීම මඟින් මූල්‍ය ස්ථායිතාව ඇති කිරීම යන පුළුල් අරමුණු ඇතිවය. එමඟින් ශ්‍රී ලාංකීය මූල්‍ය වෙළඳපොළ තුළ පවතින විවිධ නිෂ්පාදනයන්ගේ වගකීම් සහගත භාවිතය සහ සමස්ථ විචක්ෂණශීලි හා වගකීම් සහගත මූල්‍ය හැසිරීම ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මෙම මාර්ගෝපදේශය මඟින් අනාගත පරම්පරාවන්ගේ මූල්‍ය හැසිරීම හැඩගැස්වීම සඳහා ඇති අවශ්‍යතාව හඳුනාගැනීම මෙන්ම වර්තමාන සමාජයේ ආර්ථික සහ මූල්‍ය තේරීම් සිදුකරන වැඩිහිටියන්ගේ මූල්‍ය හැසිරීම සඳහා බලපෑම් කිරීම ද සිදුකෙරේ.

මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතා පාර්ශවකරුවන්ගේ එකඟත්වය මත ඇතුලත් කරන ලද අනුක්‍රමික ක්‍රියාමාර්ග මෙන්ම ඔවුන්ගේ ආයතනික භූමිකාවන් හා වගකීම් ඇතුළත් වූ පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් මාර්ගෝපදේශය යටතේ සකස් කර ඇත.

# හඳුන්වා දෙන ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා විශේෂඥ:

# Mr. Beewise

සියලු ශ්‍රී ලාංකීය සංස්කෘතීන් තුළ, මී මැස්සන් සාමාන්‍යයෙන් සැලකෙන්නේ කඩිසර, වෙහෙස මහන්සි වී වැඩ කරන, කැපවූ ඉතිරි කරන්නෙකු ලෙසය. මී මැස්සන් සමෘද්ධිය සහ තිරසාරභාවය පිළිබඳ සංකල්ප ද නියෝජනය කරයි. මීමැස්සන්ගේ හැසිරීම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය හරහා ප්‍රවර්ධනය කිරීමට උත්සහ දරන මූල්‍ය සාක්ෂරතාවයේ හරය මනාව සංකේතවත් කරන බැවින්, ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ නියෝජිතයා ලෙස “Mr. Bee Wise”තෝරා ගනු ලැබිණි.



## දැනුම සහ කුසලතා

සම්පත් සෙවීමට සහ භාවිතා කිරීමට දක්ෂ මී මැස්සන්, එදිනෙදා ජීවිතය දූරදර්ශීව මෙහෙයවීම සඳහා දැනුමේ ඇති වටිනාකම ඉස්මතු කරයි. මී මැස්සන් මල් පැණි එකතු කිරීමේ, මී පැණි සෑදීමේ හා සුරැකීමේ නිපුණතා පෙන්නුම් කරන්නේ මූල්‍ය කටයුතු සඳහා අවශ්‍ය ප්‍රායෝගික කුසලතා වන අයවැය සැකසීම, ඉතිරි කිරීම, ආයෝජනය සහ ණය කළමනාකරණය පිළිබිඹු කරමිනි.

## ආකල්ප

මී මැස්සන් ඔවුන්ගේ කාර්යයන් සඳහා සුවිශේෂී කැපවීමක් පෙන්නුම් කරයි. නොපසුබට උත්සාහයේ සහ කැපවීමේ ආකල්ප විදහා දක්වයි. පුද්ගලික මූල්‍යකරණයේදී, නිවැරදි ආකල්පය දියුණුව සඳහා මූලික වේ. මී මැස්සන් සිය රාජකාරි කෙරෙහි දක්වන කැපවීම මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ බාධක ජය ගැනීමට අවශ්‍ය ආකල්පය අවධාරණය කරයි.


## හැසිරීම්

මී මැස්සන් විසින් තම මී වදයේ සාමූහික ප්‍රයත්නයෙන් පෙන්නුම් කරන පරිදි හැසිරීම, විනයගරුක සහ වගකීම් සහගත හැසිරීම්වල වැදගත්කම අවධාරණය කරයි. මී මැස්සන් ඔවුන්ගේ යහපැවැත්ම සඳහා එක්ව ක්‍රියා කිරීම මගින් විනයගරුක ඉතිරිකිරීම්, විචක්ෂණශීලී වියදම් කිරීම් හා මූල්‍ය සැලසුම්කරණය සමස්ථ මූල්‍ය ගුණාත්මක තත්ත්වයට සහ ප්‍රජා සමෘද්ධියට දායක වන ආකාරය පෙන්නුම් කරයි.

# අර්ථ දැක්වීම්

## “මූල්‍ය හැකියාව” (FINANCIAL CAPABILITY)

පවත්නා සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වයන්ට අනුව, තම පුද්ගලික සහ ගෘහාශ්‍රිත මූල්‍ය සම්බන්ධයෙන්, මනා ලෙස දැනුවත් සහ වගකිවයුතු මූල්‍ය තීරණ සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය මූල්‍ය දැනුම, කුසලතා, ආකල්ප සහ හැසිරීම් පිළිබඳ පුද්ගලයෙකු තුල පවතින විශ්වාසය සහ නිපුණතා එම පුද්ගලයාගේ මූල්‍ය හැකියාව (Financial Capability) ලෙස අර්ථ දැක්වේ.







උද්ධමනය, සරල සහ සමුච්චිත පොලී අනුපාත සහ ආයෝජන හා ණය ගැනීම් සම්බන්ධ අවදනම් වැනි මූලික මූල්‍ය සංකල්ප තේරුම් ගැනීමට සහ ඒවා තම තීරණවලට යොදා ගැනීමට ඇති හැකියාව.

මූල්‍ය කටයුතු සහ අනාගතය සඳහා සැලසුම් කිරීම පිළිබඳ පුද්ගලයෙකුගේ මානසික තත්ත්වය, මතය සහ විනිශ්චය.







පුද්ගලික තත්ත්වයන් (Personal Circumstances) මත මූල්‍ය තීරණ වල බලපෑම තේරුම් ගැනීමට, විශ්ලේෂණය කිරීමට, මුදල් කළමනාකරණයට අදාළ නිවැරදි තීරණ ගැනීමට අවශ්‍ය හැසිරීම් සහ කුසලතා සහිතව කෙටි කාලීන හා දිගු කාලීන මූල්‍ය ඉලක්ක සඳහා සැලසුම් කිරීම, මූල්‍ය නිෂ්පාදන පිළිබඳ දැනුවත්භාවය සහ තේරීමට ඇති හැකියාව.

# මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ ප්‍රතිපත්තිමය රාමුව

## දැක්ම

අප යා යුත්තේ කොතැනට ද?

"මූල්‍ය සාක්ෂරතාවෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක්"

## මෙහෙවර

අපගේ දැක්ම ළඟා කර ගන්නේ කෙසේද?

ජනතාවගේ මූල්‍ය යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා හොඳින් දැනුවත් සහ වගකීම් සහගත මූල්‍ය තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය දැනුම, කුසලතා සහ විශ්වාසය සමඟින් ඉහළ මූල්‍ය අන්තර්ගතභාවයක් කරා සියලුම ශ්‍රී ලාංකිකයන් සවිබල ගැන්වීම

## උපායමාර්ගික ප්‍රමුඛතා

අප ප්‍රමුඛතාවය ලබා දෙන අංශ මොනවාද?

1. ඵලදායී සම්බන්ධීකරණය සහ සුසංයෝජිත විෂය කරුණු (Effective Coordination and Harmonized Content)
2. ඉහළ මට්ටමේ ධනාත්මක මූල්‍ය හැසිරීම් (Increased Positive Financial Behaviour)
3. සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත මූල්‍ය පාරිභෝගිකයින් (Vigilant and Protected Financial Consumers)
4. අනාගත පරපුරේ චර්යාත්මක වෙනසක් (Generational Behaviour Change)

## ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය

අප උගන්වන්නේ මොනවාද?

1. ආර්ථික හා මූල්‍ය පරිසරය
2. ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව
3. මූල්‍ය කළමනාකරණය
4. පාරිභෝගික ආරක්ෂණය

## මෙහෙයුම් අංශ

(Operational Pillars )


ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද?

1. මූල්‍ය සාක්ෂරතා අන්තර්ගත සංවර්ධනය සහ සුසංයෝජනය (Content Development and Harmonisation )
2. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග හඳුනා ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම (Delivery Channel Identification and Modification)
3. මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (Intervention Designing and Implementation)
4. සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම (Coordination, Monitoring and Evaluation)

## ඉලක්කගත කණ්ඩායම්

පහසුකම් සලසන්නේ කාටද?

1. තරුණ පිරිස් සහ පාසල් දරුවන්
2. අවදානමට ලක්විය හැකි ලෙස හඳුනාගත් ජන කොටස්(කාන්තා, විදේශ ශ්‍රමිකයන්, වැඩිහිටියන්, ග්‍රාමීය ජනගහනය ආදිය)
3. ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්(MSMEs)
4. වෘත්තීයවේදීන්, ආරක්ෂක නිලධාරීන් ඇතුළු රජයේ සේවකයන්




රූපය 2 - මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ ප්‍රධාන අංග එකිනෙකට සම්බන්ධ වන ආකාරය

## පළමු උපායමාර්ගික ප්‍රමුඛතාව

# ඵලදායී සම්බන්ධීකරණය සහ විෂය කරුණු සුසංයෝජනය

(Effective Coordination & Harmonized Content)

### අරමුණු

- මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි පාලන ව්‍යුහය සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම

- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා භාවිත කල හැකි, ස්ථාපිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග (Delivery Channels) හඳුනා ගැනීම සහ සුදුසු වෙනස්කම් සිදුකරමින් භාවිතා කිරීම

- විවිධ පාර්ශ්වකරුවන් විසින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා භාවිතා කළ යුතු විෂය අන්තර්ගතයේ ඒකාකාරී බව තහවුරු කිරීම

විවිධ හේතූන් මත මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුද්ගලයින් සහ ආයතන විශාල ප්‍රමාණයක් කටයුතු කරයි. බොහෝ පුද්ගලයින් මෙම ක්‍රියාකාරකම් සිදු කරනු ලබන්නේ පුද්ගලික අවශ්‍යතා මත වන අතර, ආයතනික මට්ටමින් ඔවුන්ගේ ඉලක්ක කණ්ඩායම්වල මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම ආයතනික වැඩසටහන්වල සඵලතාවය වැඩි දියුණු කිරීමේ යාන්ත්‍රණයක් ලෙස සැලකේ. උදාහරණයක් ලෙස බලපත්‍රලාභී බැංකුවක් වැනි ලියාපදිංචි මූල්‍ය සේවා සපයන්නෙකු සඳහා ඉහළ මූල්‍ය හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් සිටීම එම බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා වැදගත් වන අතර සමාජ සවිබල ගැන්වීමේ මුලපිරීම් කරන රජයේ ආයතනයන්ට තම වැඩසටහන්වල සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය සහිත පුද්ගලයින් සිටීම වැදගත් වේ.

මෙතැන් පටන් මෙම පුද්ගලයින් සහ ආයතන "මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන්" ලෙස හඳුන්වනු ලැබේ.

මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී භාවිතා කළ යුතු විෂය පථය, ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය, අවධානය යොමු කළ යුතු කරුණු, පුළුල් ආර්ථික බලපෑමක් ඇති කිරීම සඳහා අවධානයක් ලබා දිය යුතු වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (Most Vulnerable Groups) වැනි කරුණු පිළිබඳව පෙන්වා දීමට පොදු මාර්ගෝපදේශයක් නොමැති වීම හේතුවෙන්, මේ දක්වා මෙම "මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන්" විසින් තම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඉලක්කගත කණ්ඩායම දැනුවත් කිරීම සඳහා ඔවුන්ට සුදුසු ලෙස හැඟුණු විෂය පථයන් කෙරෙහි අවධානය දක්වන ලදී. තවද, මෙම "මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන්" අතර අවම සම්බන්ධීකරණයක් පැවති අතර ඔවුන්ගේ උත්සාහයන් බොහෝ විට ආර්ථිකයේ විවිධ දිශානතීන් කරා යොමු වීම හේතුවෙන් ඒවායේ පොදු සඵලතාවයට බාධා ඇති විය.

මෙම පසුබිම තුළ, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි පළමු උපාය මාර්ගික ප්‍රමුඛතාවයෙන් අවධානය යොමු කෙරෙන්නේ, රටේ සෑම මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නෙකු වෙතම ප්‍රවේශ වීම ප්‍රායෝගික නොවන බැවින්, ප්‍රධාන සහ ජාතික මට්ටමේ "මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන්" අතර ඵලදායී සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම කෙරෙහි සහ ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතා මැදිහත් වීම් සැලසුම් කිරීම සහ ලබාදීම සඳහා මඟ පෙන්වීමක් සැපයීමයි. මෙම උපාය මාර්ගික ප්‍රමුඛතාවය යටතේ අපේක්ෂා කරනු ලබන්නේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි, මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයට අනුකූලව එක් එක් ඉලක්කගත කණ්ඩායම් අරමුණු කර ගත් විස්තීර්ණ විෂය මාලාවක් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ මොඩියුලයන් ඇතුළු අදාළ උපකාරක මෙවලම් ලබා දීම යි.

මෙම මෙවලම් සියලු දෙනාට ලබාගත හැකි ලේඛන වනු ඇති අතර ශ්‍රී ලංකාව පුරා සිටින මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් හට එම මෙවලම් භාවිතා කර ශ්‍රී ලංකාවේ ධනාත්මක මූල්‍ය හැසිරීම් වැඩි දියුණු කිරීමට සහභාගී විය හැකිය.

## දෙවන උපායමාර්ගික ප්‍රමුඛතාව

# ඉහළ මට්ටමේ ධනාත්මක මූල්‍ය හැසිරීම්

## (Increased Positive Financial Behaviour)

### අරමුණු

- ශ්‍රී ලාංකිකයන්ගේ ධනාත්මක මූල්‍ය හැසිරීම් දිරිමත් කිරීම
- ඩිජිටල් ගෙවීම් ක්‍රම භාවිතා කිරීමට මූල්‍ය පාරිභෝගිකයින් සවිබල ගැන්වීම සහ දිරිමත් කිරීම
- පුද්ගලයින් සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි මූල්‍ය කළමනාකරණය සහ පොත් තැබීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම

2021 මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම , අනෙකුත් කලාපීය රටවල් හා සසඳන විට ඉදිරි මට්ටමක පවතී. කෙසේ වෙතත් එම මූල්‍ය දැනුම එහි ප්‍රශස්ථ මට්ටමේ ධනාත්මක මූල්‍ය හැසිරීමක් දක්වා පරිවර්තනය නොවන බවට පෙනී යයි.

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි දෙවන උපාය මාර්ගික ප්‍රමුඛතාවය හරහා අවධානය යොමු කරන්නේ කාලයත් සමඟ නැතිවී නොයන යහපත් සහ තිරසාර මූල්‍ය පුරුදු ඇති ශ්‍රී ලාංකික සමාජයක් ගොඩ නැංවීම පිළිබඳවයි .

ධනාත්මක මූල්‍ය ක්‍රියාකාරකම් සහිත සංස්කෘතියක් ඇති කිරීමෙන් ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික සහ මූල්‍ය හැසිරීම්වල වෙනසක් ඇති කිරීම මේ හරහා බලාපොරොත්තු වන අතර මෙම සාමූහික ප්‍රයත්නයන් මගින් පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල ආර්ථික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම තුළින් රටේ සමෘද්ධියට සහ ස්ථාවරත්වයට දායකවීම අපේක්ෂා කෙරේ

මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන, මූල්‍ය ආයතන, අධ්‍යාපන ආයතන සහ ප්‍රජා සංවිධාන අතර සහයෝගීතාවය ඉතා වැදගත් වේ.



ශ්‍රී ලංකාවේ සෑම කෙනෙකුම ඔවුන්ගේ මුදල්වලින් කුමක් කළ යුතු දැයි දන්නා, එපමණක් නොව, එය ඇත්ත වශයෙන්ම සිදු කරන එනම් - හදිසියක් සඳහා මුදලක් ඉතිරි කරන, අන්තර්ජාල මිලදී ගැනුම් සඳහා පහසුවෙන් ගෙවීම් කරන, ජංගම දුරකථන හරහා මුදල් හුවමාරු කරන, ආදායම් වියදම් සටහන් කරන - දිනයක් පිළිබඳව සිතන්න. මෙම උපායමාර්ගික ප්‍රමුඛතාවය යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන්නේ එයයි.

සියලු පාර්ශ්වකරුවන් එක්ව කටයුතු කිරීම හරහා විචක්ෂණශීලී මූල්‍ය හැසිරීම, ආර්ථික සුරක්ෂිතතාවයේ සහ වර්ධනයේ මූලික අංගයක් බවට පත්වන මූල්‍ය සාක්ෂරතාවයෙන් යුත් සමාජයක් ගොඩ නැංවීමට හැකි වනු ඇත. මේ අනුව ඉදිරියේ දී, අපගේ සාමූහික ප්‍රයත්නයන් හරහා මූල්‍ය සාක්ෂරතාවයේ මූලධර්ම හුදෙක් ඉගෙනීමට පමණක් සීමා නොවී ශ්‍රී ලාංකිකයන්ගේ එදිනෙදා ජීවන රටාවට කාවැදුනු කොටසක් බවට පත් වීම තහවුරු කරමින් මූල්‍යමය වශයෙන් සවිබල ගන්වන ලද සහ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් කරා ළඟා වීම සඳහා වැදගත් පියවරක් සනිටුහන් කිරීමට හැකි වනු ඇත.

## තෙවන උපායමාර්ගික ප්‍රමුඛතාව

# සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත මූල්‍ය පාරිභෝගිකයින්

## (Vigilant and Protected Financial Consumers)

### අරමුණු

- මූල්‍ය පාරිභෝගිකයින්ට ලබාගත හැකි ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම
- පුද්ගලික ණය තොරතුරුවල වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම

සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත පාරිභෝගිකයින් ආර්ථිකයේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සඳහා ඉතා වැදගත් වේ. මූල්‍ය පාරිභෝගිකයන් බලගැන්වීම තරඟකාරී, නව්‍ය සහ වර්ධනය වන ආර්ථික පරිසරයකට මග පාදයි. එහිදී සුපරීක්ෂාකාරීත්වය හරහා වගවීම ප්‍රවර්ධනය කරන අතර මූල්‍ය අංශය තුළ සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කරමින් විශ්වාසයේ ගොඩනැගීමට අඩිතාලමක් සපයයි.

සුපරීක්ෂාකාරී පාරිභෝගිකයින් ඕනෑම වංචනික ක්‍රියාකාරකමකින් හෝ සදාචාර විරෝධී ක්‍රියාවකින් ආරක්ෂා වීම සඳහා ඔවුන්ගේ මූල්‍ය ගනුදෙනු පිළිබඳව දැඩි විමසිල්ලෙන් පසුවේ. ඔවුන්ගේ අවධානය මූල්‍ය ආයතනවල හැසිරීම පිළිබඳව පවත්නා වරණයක් ලෙස ක්‍රියා කරන අතර ඒ හරහා මූල්‍ය ආයතන ඔවුන්ගේ ක්‍රියාකාරකම් විශ්වසනීයත්වයෙන් යුතුව සිදු කිරීමට පොළඹවනු ඇත.


පාරිභෝගිකයින් කිසියම් සැක කටයුතු ක්‍රියාවක් වාර්තා කරන විට හෝ වැරදි ක්‍රියාවන්ට එරෙහිව නැගී සිටින විට එය මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය ශක්තිමත් කිරීම, මූල්‍ය වෙළෙඳපොළ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම වැනි වැදගත් කරුණු සඳහා තීරණාත්මක අංගයක් ලෙස කටයුතු කරයි.

පාරිභෝගික ආරක්ෂණ පියවරයන් පිළිබඳව එලදායී අවබෝධයක් පැවතීම හරහා පාරිභෝගික විශ්වාසය ගොඩනැගෙන අතර ඔවුන්ට ආරක්ෂාකාරී හැඟීමක් ලබා දීම සඳහා එය වැදගත් වේ. එතුළින් ඔවුන් මූල්‍ය ක්‍රියාකාරකම්වලට සහභාගි වීම දිරිමත් කරන අතරම ඇති විය හැකි අවදානම්වලින් ආරක්ෂා වීම ද සිදුවේ.

එබැවින්, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය සකස් කිරීමේ දී පාරිභෝගික ආරක්ෂණයේ සුවිශේෂී බව හඳුනා ගනිමින්, සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත මූල්‍ය පාරිභෝගිකයින් පෝෂණය කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. මෙම ප්‍රවේශයේ අරමුණ වනුයේ ශ්‍රී ලාංකිකයන් අතර වඩාත් සුරක්ෂිත සහ සමෘද්ධිමත් මූල්‍ය අනාගතයක් කරා චර්යාත්මක වෙනසක් ඇති කිරීම යි.

ඔබ ඔබේ දෛනික අවශ්‍යතා සඳහා භාණ්ඩ මිලදී ගන්නවා යැයි සිතන්න; ඔබ කැමති දේ මොනවාද , කුමන දේවල් සඳහා වියදම් කළ යුතුද, සහ ගනුදෙනුවක් සත්‍ය විය නොහැකි තරම් අසාමාන්‍ය ලෙස ඔබට වාසිදායකද යන්න පිළිබඳව ඔබ දැනුවත් නොවේද?

දැන්, එය ඉතිරි කිරීම, ආයෝජනය කිරීම හෝ බැංකුවක් තෝරා ගැනීම වැනි මුදල් සම්බන්ධ හැසිරීමකට අදාළ කර සිතන්න. මිනිසුන් මුදල් ගැන බුද්ධිමත් වන විට- එනම් ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් විට, නරක ගනුදෙනුවක් හඳුනා ගන්නේ කෙසේදැයි දන්නා විට, හොඳම ඉතුරුම් ගිණුම සොයා ගන්නේ කෙසේදැයි අවබෝධයක් ඇති විට ඔවුහු වඩා හොඳ තේරීම් කරති. එමගින් ඔවුන්ට පමණක් නොව, වඩා හොඳ සේවා සහ මිල ගණන් ලබා දීමට බැංකු සහ ව්‍යාපාර පෙළඹවීමෙන් සැමට සහාය වේ.



### සිව්වන උපායමාර්ගික ප්‍රමුඛතාව

# අනාගත පරපුරේ චර්යාත්මක වෙනසක්

(Generational Behaviour Change)

### අරමුණු

- පාසල් දරුවන් පාසල හැර යන කාලය වන විට වඩාත් තාර්කික මූල්‍යමය තීරණ ගැනීමට හැකි පුද්ගලයින් බවට පරිවර්තනය කිරීමට සහාය වීම

- තරුණ පිරිස් අතර ධනාත්මක මූල්‍ය හැසිරීම් ඇති කිරීම

අපගේ තරුණ පරපුරෙහි මූල්‍ය දැනුම වැඩි දියුණු කිරීම අපගේ ආර්ථිකයේ වර්ධනයට අතිශයින් වැදගත් වේ. මූල්‍ය අධ්‍යාපනය මුල් කාලයේදී ආරම්භ කිරීම තුළින් අනාගතයේ දී තම මූල්‍ය කටයුතු පිළිබඳ අවබෝධයෙන් සිටින පුද්ගලයින් බිහි වන අතර තම ජීවිත කාලය පුරාවටම තමන්ට ප්‍රයෝජනවත් වන බුද්ධිමත් තේරීම් සිදු කිරීමට ඔවුන්ට හැකියාව ලැබෙනු ඇත.

අයවැය සැකසීම, ඉතිරි කිරීම සහ ආයෝජනය කිරීම වැනි මුදල් කළමනාකරණය කිරීමේ මූලික කරුණු ඉගෙනීම හරහා අධික ණය ගැනීම්, සම්පත් වැරදි ලෙස කළමනාකරණය කිරීම් වැනි වඩාත් සුලභ මූල්‍ය අන්තරායන් මඟහරවා ගැනීමට තරුණ පරපුර සූදානම් කරනු ඇත. මෙම දැනුම ඔවුන්ගේ පුද්ගලික මූල්‍ය යහපැවැත්ම පමණක් නොව සමාජ සුභසාධන වැඩසටහන් මත යැපීම් අඩුකරමින් ශක්තිමත් හා වඩාත් ස්වයංපෝෂිත සමාජයකට දායක වනු ඇත.

විශේෂයෙන්ම, ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන අංශයන් වන ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනයන් ඉහළ නැංවීම සඳහා දමන අඩිතාලමක් ලෙස මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් තරුණ ප්‍රජාව දැනුවත් කිරීම දැක්විය හැකිය. නිවැරදි මූල්‍ය කුසලතා සහිත වීම තුළින් ශ්‍රී ලංකාවට වර්තමානයේ වැදගත් වන රැකියා උත්පාදනයට සහ ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනයට දායක වෙමින් තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට තරුණයින් වඩා හොඳින් සූදානම් වනු ඇත.

මූල්‍යමය වශයෙන් දැනුවත් තරුණයින් ආර්ථික අවස්ථා හඳුනාගැනීමට සහ ග්‍රහණය කර ගැනීමට ඉතා දක්ෂ වන අතර එය පෙරළිකාර විසඳුම් ගෙන ඒමට මෙන්ම ආර්ථිකයේ ප්‍රගතියක් ඇති කිරීමට ද මඟ පාදයි. ආර්ථික පසුබිම තුළ ඔවුන්ගේ සක්‍රීය දායකත්වය තුළින් විචිත්‍රවත් ව්‍යවසායක සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර ගෝලීය වශයෙන් අපගේ තරඟකාරීත්වය වැඩි දියුණු කරනු ඇත.

මෙම ප්‍රතිලාභ හඳුනා ගනිමින් මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය, ශ්‍රී ලංකාවේ දරුවන් සහ තරුණයින් අතර මූල්‍ය සාක්ෂරතා දැනුම වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදෙයි. මෙහි ඉලක්කය වන්නේ ඔවුන් ජීවිත කාලය පුරාම මූල්‍ය කුසලතාවයන්ගෙන් සන්නද්ධ කිරීම, සමාජ සුභසාධන මත යැපීම කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය අඩු කිරීම සහ මූල්‍ය ස්වාධීනත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත පරපුරක් ඇති කිරීමයි. තව ද, නවෝත්පාදන හා ව්‍යවසායකත්වය සහිත, ආර්ථික වර්ධනයට නැඹුරු වූ පරපුරක් ඇති කිරීම මේ හරහා අපේක්ෂා කෙරේ.

මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය මඟින් තරුණ පරපුරට මූල්‍ය ලෝකය තුළ ඵලදායී ලෙස සැරිසැරීමට අවශ්‍ය දැනුම සහ මෙවලම් සැපයීමට කටයුතු කරන අතර ඔවුන්ට ආර්ථික අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට අවස්ථාව සලසයි. අනාගත පරපුරේ මූල්‍ය අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීම හරහා සමෘද්ධිමත් සහ තිරසාර අනාගතයක් සඳහා ශක්තිමත් පදනමක් ගොඩනැගීමට හැකිවනු ඇත.

මුදල් ගැන කල් තබා ඉගෙනීම දරුවන් සාර්ථකත්වයට පත් කරයි. ඔවුන් තම අවශ්‍යතා සඳහා අයවැය සැකසීමට, අනාගතය සඳහා ඉතිරි කිරීමට සහ සමහර විට, තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට හැකි වැඩිහිටියන් බවට පත්වේ.

මෙය දැනට ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය වී ඇති නව අදහස් සහ රැකියා බිහි වීම සඳහා උත්ප්‍රේරණයක් වන අතර එමඟින් මුදල් ගැන නිසි අවබෝධයක් ඇති තරුණ පිරිස් වලට, නව යෙදුමක් (Application) ආරම්භ කිරීම හෝ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම වැනි අවස්ථා හඳුනාගෙන ආර්ථිකයට නැවුම් ශක්තියක් සහ නවෝත්පාදනයක් ගෙන ඒමට හැකිය.

# ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන්
## (Key Financial Literacy Contents)

මූල්‍ය සාක්ෂරතා පෙරදැක්ම හරහා ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගත ක්ෂේත්‍ර (Key Financial Literacy Content Areas ) හතරක් කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒවා මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන් සහ මෙවලම් සංවර්ධනය කිරීමට යොදා ගනියි.




රූපය 3 : මූල්‍ය සාක්ෂරතා පෙරදැක්මෙහි ප්‍රධාන අන්තර්ගතය

# ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන්
## අප උගන්වන්නේ මොනවාද?



මූල්‍ය ලෝකය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ මූලික කරුණු අවබෝධ කර ගැනීමට සහය වීම


### ආර්ථික හා මූල්‍ය පරිසරය

මූල්‍ය සේවා සහ සේවා සපයන්නන්
මූලික සාර්ව ආර්ථික සංකල්ප
මූල්‍ය අධිකාරීන්ගේ කාර්යභාරය
මූල්‍ය තොරතුරු ලබා ගැනීම සහ මූල්‍ය සේවා තෝරා ගැනීම

බැංකුකරණයේ සිට ගෙවීම් කිරීම දක්වා සබැඳි මූල්‍ය සේවා පහසු හා සුරක්ෂිත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම

### ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය

ඩිජිටල් මූල්‍ය සේවා හැඳින්වීම
අන්තර්ජාල බැංකුකරණය
ජංගම බැංකු යෙදුම්
කාඩ්පත් ගෙවීම්
ආරක්ෂාව



අයවැයකරණයේ සිට ඉතිරි කිරීම් සහ ආයෝජනය දක්වා සංකල්ප හඳුන්වා දෙමින් ඵලදායී ලෙස මූල්‍ය කළමනාකරණයට උපකාර කිරීම

### මූල්‍ය කළමනාකරණය

ආදායම් උත්පාදනය
ඉතුරුම්
අයවැය සකස් කිරීම
ණය කළමනාකරණය
ආයෝජනය
රක්ෂණය
බදු

මූල්‍ය ගනුදෙනුවලදී ඔවුන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය දැනුමෙන් පුද්ගලයන් බලගැන්වීම

### පාරිභෝගික ආරක්ෂාව

වංචා හඳුනාගැනීම
අවදානම සහ ප්‍රතිලාභ
රෙගුලාසි සහ පාරිභෝගික ආරක්ෂාව
මූල්‍ය අධ්‍යාපනය, තොරතුරු හා උපදෙස්
අයිතිවාසිකම් සහ වගකීම්







# ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන් අප ලබා දීමට අවශ්‍ය කුමන පණිවුඩ ද?

ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා පණිවුඩ (Key Financial Literacy Messages) යනු මූල්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන මූලධර්ම, මූලික සංකල්ප සහ අරමුණු අඩංගු නිශ්චිත, කෙටි ප්‍රකාශයන් වේ. තම මූල්‍ය ඉලක්කයන් සපුරා ගැනීමට අවශ්‍ය මූල්‍ය තීරණවලට දැනුවත් ලෙස එළඹීම සඳහා ඉලක්ක කණ්ඩායම් සවිබල ගැන්වීම වෙනුවෙන් මෙම පණිවුඩ සැලසුම් කර ඇත. පුළුල් මූල්‍ය සාක්ෂරතා මාතෘකා මතකයේ රැඳෙන ලෙස කෙටියෙන් සාරාංශ කිරීමට මෙම ක්‍රමය උපකාරී වේ.

පෙර තීරණය කරන ලද මූල්‍ය සාක්ෂරතා පණිවුඩවල පවත්නා විශේෂ ලක්ෂණ හේතුවෙන් ඒවා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වැදගත්වේ. එම ලක්ෂණ වලින් කිහිපයක් පහත දැක්වේ.

- පණිවුඩය ලබන්නාට පණිවුඩය පිළිබඳව පැහැදිලි බවක් හා අවධානයක් ලබා දේ.
- කුමන පාර්ශ්වකරුවෙක් විසින්, කුමන වැඩසටහනකදී භාවිතා කළ ද, එකම පණිවුඩය බෙදාහැරීම නිසා මාර්ගෝපදේශයට අනුකූල බව සහ සුසංයෝගී බව තහවුරු වේ.
- ඵලදායී සන්නිවේදනය සඳහා රාමුවක් සපයයි.
- මූල්‍ය හැසිරීම් වෙනස් කිරීමට බලපෑම් කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- විශේෂිත කණ්ඩායම් සඳහා මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය අභිරුචිකරණයට සහ ඉලක්ක කිරීමට (Customization and Targeting) සහාය වේ.
- මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් සඳහා මිනුම් සහ ඇගයීම් (Measurement and Evaluation) සඳහා පදනමක් සපයයි.

පාර්ශ්වකරුවන් විසින් ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් නිර්මාණය කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන්ට සහ මාතෘකාවලට අනුකූලව, එක්ව සහ සහයෝගිතාවයෙන් යුතුව ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා පණිවුඩ ගොඩනගනු ඇත.

**සිහියෙන් තොරව ඉතිරි කරන්න - සිහියෙන් වියදම් කරන්න**

**ඉතුරුම් පළමුව, වියදම් දෙවනුව**

**කවදාවත් ඔබේ PIN , OTP හෝ රහස් අංකය බෙදාගන්න එපා**

**ඔබගේ කාඩ්පතෙහි ඇති දුරකථන අංකය අමතන්න**

**ඔබේ මූල්‍යය ගිවිසුමේ  ඇති සියුම් මුද්‍රිත හැම වෙලාවෙම කියවන්න**

**බිල්පත් නිසි වෙලාවට ගෙවා ඔබගේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නංවාගන්න**

**අමුතු ලෙස දෙන වාසි - අවදානමක් වේවි**

**මූල්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කරන්න - මූල්‍ය නිදහස භුක්ති විඳින්න**

**උවමනයි ද? අවශ්‍යයි ද? - වියදමකට පෙර හිතමුද?**

**ආදායම ඉහළ යන විට ප්‍රඥාවන්තව වියදම් කරන්න**

# මූලික නිපුණතා රාමුව

## (Core Competencies Framework)

## අපට දියුණු කිරීමට අවශ්‍ය හැකියාවන් මොනවාද?

මූලික නිපුණතා රාමුව, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය (Key Financial Literacy Contents) මූල්‍ය නිපුණතා සමඟ සම්බන්ධ කරයි. මෙම මූලික නිපුණතා රාමුව තුළ, පුද්ගලයෙකු තම පුද්ගලික මූල්‍ය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී පෙන්නුම් කරන දැනුම, කුසලතා, ආකල්ප සහ හැසිරීම්වලට අනුරූප වන මූල්‍ය හැකියාව පිළිබඳ පොදු නිර්වචන භාවිතා වේ.

මූලික නිපුණතා රාමුව මගින් ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් වෙත ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතා ක්‍රියාකාරකම්වල අන්තර්ගතය, රටෙහි අනෙකුත් මූල්‍ය සාක්ෂරතා ක්‍රියාකාරකම් සමඟ සුසංයෝගී ප්‍රවේශයක් (Harmonized Approach) භාවිතා කරමින් සැලසුම් කිරීම සඳහා මූලික මග පෙන්වීමක් සපයයි. ඒ හරහා මූල්‍ය සාක්ෂරතා ක්‍රියාකාරකම් තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත මූල්‍ය සාක්ෂරතා ප්‍රතිඵල මාලාවක් ද (Financial Literacy Outcomes) ඉදිරිපත් කෙරේ. තවද, පවතින නිපුණතා හඳුනා ගැනීමට සහ පවතින මූල්‍ය සාක්ෂරතා මූල පිරීම්වල පරතරයන් (Competency Gaps) හඳුනා ගැනීමට ද මූලික නිපුණතා රාමුව භාවිතා කළ හැකිය .

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි මූලික නිපුණතා රාමුව, මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා වන සන්ධානයේ (Alliance for Financial Inclusion - AFI)[1] "වැඩිහිටියන් සඳහා වන මූලික නිපුණතා රාමුව" මත පාදක වේ. මෙම මූලික නිපුණතා රාමුව, ප්‍රතිපත්තිමය අවශ්‍යතා පැන නගින විට සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වෙනස්වන විට කාලානුරූපව යාවත්කාලීන කළ හැකි ලේඛනයක් වේ.

මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් සැලසුම් කිරීම සඳහා මෙම මූලික නිපුණතා රාමුව භාවිතා කළ හැකිය.

"මෙම මැදිහත්වීම මගින් ඉලක්ක කණ්ඩායම තුළ ඇති කිරීමට අපට අවශ්‍ය නිපුණතා මොනවාද?" හෝ "මැදිහත්වීම අවසන් වූ පසු අපි එහි බලපෑම නිරීක්ෂණය කර ඇගයීමට ලක් කරන්නේ කෙසේද?" වැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සොයමින් මූලික නිපුණතා රාමුව පරිශීලනය කිරීම මගින් එය වඩාත් සුදුසු සහ ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීමට හැකි වනු ඇත.

කෙසේ වෙතත්, රටෙහි සියලුම පුද්ගලයින් තුළ මූලික නිපුණතා රාමුවෙහි දක්වා ඇති සියලුම නිපුණතා තිබිය යුතු යැයි අපේක්ෂා නොකෙරේ. පුද්ගලික අවශ්‍යතා, සංස්කෘතිය සහ සමාජයීය හා ආර්ථික සන්දර්භය වැනි විවිධ සාධක මත පදනම්ව, පුද්ගලයෙකුගේ මූල්‍ය යහපැවැත්ම වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිපුණතා වෙනස් විය හැකිය. මේ අනුව, විවිධ පුද්ගලයින්ගේ කණ්ඩායම්වලට අවශ්‍ය වන නිපුණතාවන්හි සංකලනයන් ද විවිධාකාර වේ.

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි මූලික නිපුණතා රාමුව සැමට භාවිතා කළ හැකි පොදු ලේඛනයක් වේ.

---

[1] AFI යනු දේශීය සහ ජාත්‍යන්තර මට්ටමින් මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ පොදු අරමුණ සහිතව, සාමාජික මහ බැංකු සහ මූල්‍ය නියාමන ආයතනවල හිමිකාරීත්වයෙන් සැදුම්ලත් ප්‍රතිපත්තිපාදක සන්ධානයකි.

# මූලධර්ම සහ මාර්ගෝපදේශ [2]

## (Principles and Guidelines)

## ක්‍රියාත්මක කිරීමේදී අප සලකා බැලිය යුත්තේ මොනවාද?

රට පුරා විසිරී සිටින මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන්ගේ මූල්‍ය සාක්ෂරතා මූලපිරීම් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූලධර්ම සහ මාර්ගෝපදේශ ලබා දීම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය හඳුන්වා දීමේ එක් අරමුණකි. මෙම මූලධර්ම සහ මාර්ගෝපදේශ, මූල්‍ය අධ්‍යාපන මූලපිරීම්වල ඵලදායී බව පිළිබඳව සිදු කරන ලද අන්තර්ජාතික මට්ටමේ පර්යේෂණවල සොයා ගැනීම් ලෙස දැක්විය හැකිය.

**මූල්‍ය අධ්‍යාපන පණිවුඩ ලබා දීමට විවිධ ක්‍රම සහ මාර්ගයන් භාවිතා කරන්න**

එය මෙම පණිවුඩ සඳහා ඉහළ ප්‍රවේශයක් ලබා දෙමින් මතකයේ රැඳෙන ස්වභාවය ඉහළ නැංවීම සහතික කරනු ඇත.

**මූල්‍ය අධ්‍යාපනය එදිනෙදා ජීවිත සිදුවීම් සමඟ ඒකාබද්ධ කරන්න**

මිනිසුන්ගේ දෛනික ජීවිතයට මූල්‍ය අධ්‍යාපන පණිවුඩ සහ චර්යාත්මක පෙළඹවීම් (Behavioural Nudges) ඒකාබද්ධ කිරීම, ස්වභාවික ආකාරයෙන් හොඳ මූල්‍ය පුරුදු වර්ධනය කිරීමට උපකාරී වේ.

**යොදා ගන්නා මූල්‍ය අධ්‍යාපන සම්පත්වල පරිශීලක-හිතකාමී බව සහතික කර ගන්න**

විස්තීර්ණ සම්පත් තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒවා මිනිසුන්ට භාවිතා කිරීමට සහ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි, ප්‍රවේශ වීමට සහ අවබෝධ කර ගැනීමට පහසු, පරිශීලක-හිතකාමී සම්පත් විය යුතුය.

**පවතින මූල්‍ය අධ්‍යාපන සම්පත් භාවිතය වැඩි කිරීමට සහ ඒවා කෙරෙහි උනන්දුව පවත්වා ගැනීමට විශේෂ උත්සාහයක් දරන්න**

වෙනත් ඕනෑම නිෂ්පාදනයක් මෙන්ම, මූල්‍ය අධ්‍යාපන සම්පත් ද නිරන්තරයෙන් ප්‍රවර්ධනය කළ යුතුය.

Source: WBG 2020. Digital and Financial Literacy Interventions: Country Case Studies

**ඔබේ ඉලක්ක කණ්ඩායම මත පදනම්ව සම්ප්‍රදායික හෝ නවීන බෙදාහැරීමේ ක්‍රම (Methods of delivery) තෝරා ගන්න**

ඇතැම් පාරිභෝගික කොටස් සඳහා (උදා: වැඩිහිටියන්) , ඩිජිටල් මෙවලම් සහ සේවා භාවිතා කරන ආකාරය වැනි නව දැනුම සහ කුසලතා ඉගැන්වීම සඳහා සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම භාවිතය වඩාත් හොඳින් ක්‍රියා කරන බව පෙනී යයි

**මූල්‍ය අධ්‍යාපනය ලබා දීමේදී, ස්වයං හඳුනා ගැනීම් (self-identification) සහ චිත්තවේගීය සම්බන්ධතා (emotional connection) ගොඩනගන්න**

මූල්‍ය අධ්‍යාපනය වඩාත් හොඳින් ක්‍රියාත්මක වන්නේ ගනුදෙනුකරුවන් තමන්ව හඳුනාගෙන මූල්‍ය අධ්‍යාපන පණිවුඩ ලබා දෙන්නන් සමඟ චිත්තවේගීය සම්බන්ධතා ගොඩනඟා ගන්නා විට සහ ඔවුන්ගේ තත්වයන්ට අනුගත විය හැකි අවස්ථා වලදීය

**ප්‍රධාන මූල්‍ය අධ්‍යාපන පණිවුඩ නැවත නැවත කැඳවන්න.**

එක වරකදී ලැබෙන සැලකිය යුතු මට්ටමක ඉහල ප්‍රතිචාරය, පණිවුඩය දීර්ඝ කාලීනව රඳවා තබා ගැනීම පිළිබඳ සහතිකයක් නොවිය හැකි අතර ඒ සඳහා මූල්‍ය අධ්‍යාපන පණිවුඩ නැවත නැවත ලබා දිය යුතු වේ

**විනෝදයත් සමඟම අධ්‍යාපනය ලබා දෙන්න.**

විශේෂයෙන්ම ළමුන් සහ තරුණයින් සඳහා, විනෝදස්වාදය ප්‍රමුඛ කර ගත් ඉගෙනුම් මාධ්‍යය යොදා ගැනීම, මූල්‍ය සාක්ෂරතාවය වැඩි කිරීමට සහ හොඳ මූල්‍ය පුරුදු ඇති කිරීමට ප්‍රබල ලෙස දායක විය හැකිය

**ඔබේ මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් පූර්ණ මට්ටමින් දියත් කිරීමට පෙර ඒවා නියමු අදියරක් ලෙස පරීක්ෂා කරන්න.**

මෙමගින් අපේක්ෂිත බලපෑමක් ඇති නොවන මැදිහත්වීම් මත සම්පත් නාස්ති වීම වැළැක්විය හැකිය

**යම් දෙයකට කැමති වීම යනු එය තේරුම් ගැනීම හෝ භාවිතා කිරීම නොවේ.**

මූල්‍ය අධ්‍යාපන පණිවුඩවලට ලැබෙන ධනාත්මක ප්‍රතිචාර මගින් ගනුදෙනුකරුවන් ඒවා තේරුම් ගැනීම හෝ නව හැසිරීම් අනුගමනය කිරීම සෑම විටම අදහස් නොවේ

**බලපෑම් ඇගයීමේ (Impact Evaluation) ක්‍රමවේදය පිළිබඳව කල් තියා සිතන්න.**

මූල්‍ය අධ්‍යාපන මැදිහත්වීමක බලපෑම අවබෝධ කර ගැනීමේදී ඇගයීම වැදගත් වේ. පෙර තීරණය කරන ලද ඇගයීම් රාමුවක් රහිත මැදිහත්වීම් හෝ වැඩසටහන් වල ප්‍රතිඵල අවිනිශ්චිත විය හැකිය

# මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරී සැලැස්ම

## අප ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරී සැලැස්ම සියලු මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන් එක්ව සහයෝගයෙන් නිර්මාණය කරන ලද අතර මනා සම්බන්ධීකරණයෙන් යුතුව මෙන්ම සමගාමී ප්‍රවේශයක් සහිතව මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම මෙම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ඉලක්කය වේ. ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් සියලු ක්‍රියාමාර්ග, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ උපාය මාර්ගික ප්‍රමුඛතා යටතේ ඇති අරමුණු ළඟා කර ගැනීම සඳහා විචක්ෂණශීලීව සැලසුම් කර තිබේ.

මෙම සෑම ක්‍රියාමාර්ගයක්ම, පහත දක්වා ඇති මෙහෙයුම් අංශවලින් එක් අංශයකට අයත් වේ. මෙම මෙහෙයුම් අංශ, ක්‍රියාමාර්ගවල ස්වභාවය අනුව වර්ග කරන හෙයින් උපාය මාර්ගික ප්‍රමුඛතා කිහිපයකට අයත් ක්‍රියාමාර්ග, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමේදී එක් මෙහෙයුම් අංශයකට අයත් විය හැකිය. සෑම මෙහෙයුම් අංශයක් සඳහාම, අදාළ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි පාලන ව්‍යුහය තුළ ක්‍රියාත්මක වේ.

තවද, පාර්ශ්වකරුවන් විසින් එක්ව සැලසුම් කරන ලද මෙම මාර්ගෝපදේශය හා එහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය සහය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් (UNDP) ලබා ගැනීමට නියමිත ය.




රූපය 4 - මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි මෙහෙයුම් අංශ

# මෙහෙයුම් අංශ

## (Operational Pillars )

## ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද?

### පළමු මෙහෙයුම් අංශය

### මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය සංවර්ධනය සහ සුසංයෝජනය (Content Development and Harmonization )


ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් රාශියක් සිටින අතර ඔවුන්ගේ විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා නිර්මාණය කර ඇති විවිධ මූල්‍ය සාක්ෂරතා සම්පත් භාවිතා කරනු ලබයි.

මෙම මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් විසින් ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් සඳහා විශාල උත්සාහයක් සහ සක්‍රිය දායකත්වයක් යොදවන බැවින්, සැලසුම් කිරීමේ සහ බෙදා හැරීමේ ක්‍රියාවලියේදී ඔවුන් ලබා ගැනීමට අවධානය යොමු කළ යුතු ප්‍රධාන ප්‍රතිඵල පිළිබඳව ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීමෙන්, එම මැදිහත්වීම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම මඟින් ඔවුන්ව මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක් කරා යන ගමනට දායක කර ගත හැකිය.

මාර්ගෝපදේශයෙහි ජාතික මට්ටමේ පාර්ශ්වකරුවන්ගේ මූල්‍ය සාක්ෂරතා ප්‍රයත්නයන් ඒකාබද්ධ කිරීමට සහ සුසංයෝගී කිරීමට පසුබිමක් සැකසීම තුළින් එම ප්‍රයත්නයන් නැවත නැවත සිදුකිරීම වළක්වා ගත හැකිය. තවද, පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාවයක් ඇති කිරීම හරහා ඔවුන්ට ඒක්ව ක්‍රියාත්මක වීමට සහ අවම සම්පත් භාවිතයකින් උපරිම ප්‍රතිඵලයක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

මෙම මෙහෙයුම් අංශය යටතට ගැනෙන ක්‍රියාමාර්ග වලින් වැඩි කොටසක් "ඵලදායී සම්බන්ධීකරණය සහ විෂය කරුණු සුසංයෝජනය" (Effective Coordination and Harmonized Content) යන උපාය මාර්ගික ප්‍රමුඛතාවය යටතේ සැලසුම් කරන ලද ක්‍රියාමාර්ග වනු ඇත.

උදාහරණයක් ලෙස, සියලුම ඉලක්ක කණ්ඩායම් ආවරණය වන පරිදි මාධ්‍ය ප්‍රචාරක වැඩසටහනක් පැවැත්වීමට අවශ්‍ය වීඩියෝ පට හා සමාජ මාධ්‍ය දැන්වීම් මෙම මාර්ගෝපදේශය හරහා පාර්ශ්වකරුවන්ගේ ඒකඟතාවයෙන් නිර්මාණය කළ හැකි අතර සියලුම පාර්ශ්වකරුවන්ට නව නිර්මාණයන් සඳහා ඔවුන්ගේ සම්පත් වැය නොකර එම වීඩියෝ පට හා සමාජ මාධ්‍ය දැන්වීම් භාවිතා කිරීමට හැකිවේ.
විශේෂයෙන්ම, රටේ සියලුම මූල්‍ය සාක්ෂරතා සේවා සපයන්නන් සඳහා මාර්ගෝපදේශයක් ලෙස මූල්‍ය සාක්ෂරතා විෂය මාලාවක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර එවිට තම අවශ්‍යතා සපුරාලීම සඳහා එම විෂය මාලාව භාවිතා කරමින් මැදිහත් විය යුත්තේ කෙසේ දැයි පාර්ශ්වකරුවන්ට වටහා ගැනීමට හැකි වනු ඇත.



# පළමු මෙහෙයුම් අංශය

## මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය සංවර්ධනය සහ සුසංයෝජනය යටතේ වන ප්‍රධාන ක්‍රියාමාර්ග

## (Content Development and Harmonization )

**පොදු මූල්‍ය සාක්ෂරතා සන්නාමයක් සංවර්ධනය කිරීම**

**පවතින සම්පත්, පැවතිය හැකි පරතරයන් සහ එකිනෙකා අතර පවතින සම්මතයන්** (Overlaps) **හඳුනා ගැනීමට දැනට පවත්නා මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන් විශ්ලේෂණය කිරීම**

**උපායමාර්ගික ප්‍රමුඛතා, ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන් සහ ඉලක්ක කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කරමින් මූල්‍ය සාක්ෂරතා සම්පත්/මොඩියුල සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම**

**සියලුම පාර්ශ්වකරුවන්ට පවතින සම්පත් භාවිතා කිරීමට හැකියාව ලබා දීම සඳහා පොදු සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි විද්‍යුත් වේදිකාවක්** (e-platform) **ස්ථාපිත කිරීම සහ එය යාවත්කාලීන කිරීම**

**කළමනාකරණ උපාධි අපේක්ෂකයින්ගේ අනිවාර්ය පැවරුමක් ලෙස, විද්‍යුත් ඉගෙනුම් වේදිකාවෙහි ප්‍රකාශනය කළ හැකි පරිදි, මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ ස්වයං උපකාරක මාර්ගෝපදේශයක්** (Self-help Guide on Financial Literacy) **සම්පාදනය කිරීම**

**අවශ්‍යතා පදනම මත පාර්ශ්වකරුවන් සඳහා මාර්ගෝපදේශක වැඩමුළු පැවැත්වීම**

**මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතයන් බෙදාහැරීමේ අනුකූලතාව සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි පුහුණුකරුවන් පුහුණු කිරීමේ** (ToT) **වැඩසටහන් පැවැත්වීම**

**මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන පණිවුඩවල අනුකූලතාව සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වන ප්‍රමිතීන් ඇතුළත් මාර්ගෝපදේශ පොතක් ප්‍රකාශයට පත් කිරීම**

**ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා පුහුණුකරුවන්ගේ තත්ත්ව ප්‍රමිතීන් සහ කර්මාන්ත කීර්ති නාමය** (Industry Reputation) **ඉහළ නැංවීම සඳහා "සහතික ලත් මූල්‍ය සාක්ෂරතා පුහුණුකරුවන්" නිර්මාණය කිරීමේ වැඩසටහනක් හඳුන්වා දීම**

# දෙවන මෙහෙයුම් අංශය

## වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග හඳුනා ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම
(Delivery Channel Identification and Modification)

මෙම මාර්ගෝපදේශය නිර්මාණය කිරීමේ මූලික අදියරයන්හිදී පැවැත්වූ පාර්ශ්වකරුවන්ට උපදේශන වැඩසටහන්වලදී (Stakeholder Consultation Sessions) බොහෝ මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ එදිනෙද කටයුතු සඳහා භාවිතා කරනු ලබන ඉතා හොඳින් ස්ථාපිත කරන ලද ජාල (Well-established networks ) ඇති බව අපි හඳුනා ගත්තෙමු. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල
- සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රජා සෞඛ්‍ය ජාලය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන විසින් තම පාරිභෝගිකයන් වෙත තොරතුරු දැන්වීමට භාවිතා කරන කෙටි පණිවිඩ සේවා
- කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යංශයේ කාන්තා සංවර්ධන නිලධාරීන්
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විදෙස් සේවා පුහුණු වැඩසටහන්
- කර්මාන්ත අමාත්‍යංශය යටතේ පවතින ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි smeconnect.lk විද්‍යුත් වේදිකාව
- පාසල්, විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (Sri Lanka Insurance Institute) වැනි අධ්‍යාපන ආයතන
- වෘත්තීය පුහුණු ආයතන

.

මෙම ජාලවලට රට පුරා පුළුල් ව්‍යාප්තියක් පවතින අතර මෙම මාර්ගෝපදේශයෙහි ඉලක්ක කණ්ඩායම් වෙත ඉතා හොඳ ප්‍රවේශයක් ද පවතී. මේ අනුව, මාර්ගෝපදේශයෙහි මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය බෙදා හැරීමට සහ ඉලක්ක කණ්ඩායම් සමඟ සම්බන්ධ වීමට මෙම ජාල, තොරතුරු බෙදා හැරීමේ මාධ්‍යයක් ලෙස භාවිතා කළ හැකිය. එමඟින් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ යන අතර සම්පත් භාවිතය ද උපරිම අයුරින් සිදු වනු ඇත.

මෙම බෙදා හැරීමේ ජාල මුලදී මාර්ගෝපදේශය යටතේ මූල්‍ය සාක්ෂරතා දැනුම බෙදා හැරීමේ මාර්ග ලෙස භාවිතා කිරීමට අදහස් කර නොතිබූ බැවින් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ පවතින ස්වභාවය විශ්ලේෂණය කර දැනට පවතින සැලැස්මට අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දීමට සිදුවිය හැකියි

## දෙවන මෙහෙයුම් අංශය

### වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග හඳුනා ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම යටතේ වන ප්‍රධාන ක්‍රියාමාර්ග
(Delivery Channel Identification and Modification)

**මූල්‍ය සාක්ෂරතා මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ හැකි දැනට පවතින බෙදාහැරීමේ මාර්ග සහ ජාල හඳුනා ගැනීම සහ සුදුසු පරිදි යොදා ගැනීම**

**ඩිජිටල් අන්තර්ගතයන් සහ අනෙකුත් පාරිභෝගික ආරක්ෂණ තොරතුරු (වෙබ් අඩවි, කෙටි පණිවුඩ සේවා, සමාජ මාධ්‍ය, ජංගම මුදල් යෙදවුම් ආදිය) බෙද හැරීම සඳහා පවතින මාර්ග සහ සම්පත් භාවිතා කිරීම**

**මූල්‍ය සාක්ෂරතා අන්තර්ගතය බෙදා හැරීම සඳහා** Whatsapp, Tiktok, Instagram **වැනි නව සමාජ මාධ්‍ය ක්‍රම හඳුන්වා දීම සහ භාවිතා කිරීම**

**ජාතික ශිෂ්‍යභට බලකාය, ජාතික යොවුන් සේනාංකය වැනි තරුණ සහභාගිත්වය සහිත වෙනත් ආයතන සමඟ සහයෝගිතා ඇති කර ගැනීම.**

## තෙවන මෙහෙයුම් අංශය - මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

(Intervention Designing and Implementation)

පෙර සඳහන් කළ මෙහෙයුම් අංශ දෙක මත පදනම්ව, ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම වැඩිදියුණු කිරීමේ අරමුණින්, ඉලක්කගත කණ්ඩායම් සඳහා මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කෙරෙනු ඇත.

මෙම මැදිහත්වීම් හරහා මූලිකවම, ඉහළ මට්ටමේ ධනාත්මක මූල්‍ය හැසිරීම් (Increased Positive Financial Behaviour), සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත මූල්‍ය පාරිභෝගිකයින් (Vigilant and Protected Financial Consumers), අනාගත පරපුරේ චර්යාත්මක වෙනසක් (Generational Behaviour Change) යන උපාය මාර්ගික ප්‍රමුඛතා තුන යටතේ පවතින අරමුණු කරා ළඟා වීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාමාර්ග හරහා මාර්ගෝපදේශයෙහි සියලු ඉලක්කගත කණ්ඩායම් ආවරණය වනු ඇත.

ඉලක්කගත කණ්ඩායම්වල සැබෑ මූල්‍ය හැසිරීම් වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ට මූල්‍ය දැනුම ලබාදීමෙන් ඔබ්බට ගොස් පුහුණු කිරීම සහ හුරුකිරීම් ඇතුළත් සමහර මැදිහත්වීම් හඳුන්වා දීමට යාන්ත්‍රණයක් මෙම මාර්ගෝපදේශය යටතේ හඳුන්වා දීමට උත්සාහ කරන අතර එම ක්‍රියාවලිය ඉතා පහසු කටයුත්තක් නොවනු ඇත.

### තෙවන මෙහෙයුම් අංශය

මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යටතේ වන ප්‍රධාන ක්‍රියාමාර්ග

(Intervention Designing and Implementation)

**ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, කාන්තාවන් සහ තරුණයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම් වැඩි දියුණු කිරීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම.**

**ශ්‍රී ලංකාවේ ප්‍රජා සෞඛ්‍ය ජාලය හරහා මූල්‍ය සේවා වඩාත් විශ්වාසයෙන් භාවිතා කිරීමට ශ්‍රී ලාංකික කාන්තාවන් හුරුකරවීම සහ බලගැන්වීම.**

**මූල්‍ය කළමනාකරණය සහ නවතම ඩිජිටල් මුදල් හුවමාරු තාක්ෂණයන් ආදිය පිළිබඳව සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම හා ඒවාට හුරු කරවීම**

**ත්‍රී රෝද රථ, කැබ් රථ රියදුරන් අතර QR ගෙවීම් ක්‍රම හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම මඟින් ඔවුන්ගේ මූල්‍ය හැකියාවන් වැඩි දියුණු කරමින් ගෙවීම් ලබාගැනීම සඳහා QR කේත සහ ජංගම මුදල් යෙදවුම් භාවිතා කිරීමේ වාසි පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම.**

**මාධ්‍යවේදීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඉහළ ආදායම්ලාභී තරුණ පිරිස්, ආරක්ෂක අංශයේ සාමාජිකයින්, මූල්‍ය අංශයේ වෘත්තිකයන්, පූර්ව විශ්‍රාමිකයින් ඇතුළු රජයේ සේවකයින් සඳහා නිශ්චිත දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වීම.**

**රජයේ ලියාපදිංචි පාසල් සඳහා ජාතික මූල්‍ය සාක්ෂරතා සතියක්/ජාතික මුදල් මාසයක් හඳුන්වා දීම.**

**මූල්‍ය සාක්ෂරතාවය අනිවාර්ය විෂයක් ලෙස ජාතික අධ්‍යාපන විෂය මාලාවට සහ වෘත්තීය සුදුසුකම්වල විධිමත් විෂය මාලාවට ඇතුලත් කිරීම.**

**ශිෂ්‍යභට බලකාය, ජාතික තරුණ බලකාය වැනි තරුණ සහභාගිත්වය සහිත වෙනත් ආයතන සමඟ සහයෝගීතා ස්ථාපිත කිරීම**

# සිව්වන මෙහෙයුම් අංශය - සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම
(Coordination, Monitoring and Evaluation)

ඕනෑම ජාතික මට්ටමේ මාර්ගෝපදේශයක් සාර්ථක වීමට නම් එය පුළුල්, දියුණු හා ප්‍රායෝගික "සම්බන්ධීකරණ, ඇගයීම් සහ අධීක්ෂණ රාමුවක්" යටතේ ක්‍රියාත්මක විය යුතුය.

මෙම මාර්ගෝපදේශය, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපායමාර්ගය යටතේ හඳුන්වා දී ක්‍රියාත්මක කරන අතර, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපායමාර්ගය සඳහා දැනටමත් එවැනි රාමුවක් ක්‍රියාත්මක වේ. ඵලදායීතාව තහවුරු වී ඇති එම මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපායමාර්ගික පාලන ව්‍යුහයට මෙම මාර්ගෝපදේශයද ඇතුළත් කර ඇති අතර ඒ හරහා ස්ථාවර වූ අධීක්ෂණ සහ ඇගයීම් ප්‍රවේශයක් භාවිතා කරනු ඇත. ඒ අනුව, මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා පාලන ව්‍යුහය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සිදුවනු ඇත.

මේ අනුව, මාර්ගෝපදේශයෙහි සියලුම මෙහෙයුම් අංශ නියෝජනය කිරීම සඳහා නව ක්‍රියාකාරී කමිටු හතරක් (Working Groups) හඳුන්වා දෙනු ලැබේ.

මෙම ජාතික ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා ජාතික මට්ටමේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ඉහළ මට්ටමේ සහයෝගයක් අවශ්‍ය වේ. ඒ සඳහා සෑම පාර්ශ්වකරුවෙකුම මූල්‍ය සාක්ෂරතාවය ඔවුන්ගේ ප්‍රතිපත්ති අරමුණු සමඟ පෙළගස්වා ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකමින් ප්‍රමුඛතාවය දිය යුතු වේ.

## සිව්වන මෙහෙයුම් අංශය

### සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම යටතේ වන ප්‍රධාන ක්‍රියාමාර්ග
(Coordination, Monitoring and Evaluation)

- **මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපායමාර්ගික පාලන ව්‍යුහය පුළුල් කිරීම**
- **මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ශක්තිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම**
- **දත්ත රැස් කිරීම සඳහා සමෝධානිත සහ ඒකාබද්ධ ප්‍රවේශයක් ගොඩ නැංවීම**
- **සියලුම පාර්ශවකරුවන්ගේ භාවිතය සඳහා ඵලදයී ඇගයීම් යාන්ත්‍රණයක්/ රාමුවක් හඳුන්වා දීම**
- **මූල්‍ය සාක්ෂරතා මැදිහත්වීම්වල බලපෑම මැන බැලීම සඳහා මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් පැවැත්වීම**






රූපය 5 _ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ විස්තීරණය කරන ලද පාලන ව්‍යුහය

"මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන්
ශ්‍රී ලංකාවක් කරා"



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**Regional Development Department**
**Central Bank of Sri Lanka**
No. 30, Janadhipathi Mawatha
Colombo 01, Sri Lanka
www.rdd.cbsl.lk

IFC International Finance Corporation
WORLD BANK GROUP

Australian Aid

**United Nations Development Programme (UNDP)**
UN Compound
202-204,
Bauddhaloka Mawatha
Colombo 7,
Sri Lanka